සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

පෙරදිග සංගීතය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. නිර්දේශිත රාග අතුරින් යමන් රාගයට පමණක් සුවිශේෂී වූ කරුණ සඳහන් පිළිතුර කුමක් ද?
(1) ජාතිය සම්පූර්ණ වීම. (2) විකෘති ස්වර හතරක් යෙදීම.
(3) මධ්‍යමය තීව්‍ර වීම. (4) ගාන්ධාරය වාදී ස්වරය වීම.

02. කල්‍යාණ ඨාඨයෙන් ඉපදුණ රාග යුගලය තෝරන්න.
(1) යමන් සහ භෛරවී (2) බිලාවල් සහ භූපාලි
(3) කාෆි සහ භෛරවී (4) භූපාලි සහ යමන්

03. ප්‍රකෘති සහ විකෘති ස්වර සියල්ල ම යොදාගත හැකි නිර්දේශිත රාගය වන්නේ,
(1) භෛරවී රාගය යි. (2) බිලාවල් රාගය යි. (3) කාෆි රාගය යි. (4) යමන් රාගය යි.

04. භූපාලි රාගයේ අනුවාදී ස්වර ගණන,
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

05. මධ්‍යම රාත්‍රියේ දී ගායනයට සහ වාදනයට සුදුසු නිර්දේශිත රාගය කුමක් ද?
(1) කාෆී (2) බිලාවල් (3) භෛරවී (4) යමන්

06. නිර්දේශිත රාග පිළිබඳව පහත දී ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) භෛරවි රාගයේ මධ්‍යමය විකෘති ස්වරය වේ.
(2) බිලාවල් රාගයේ ස්වර දෙකක් වර්ජිත වේ.
(3) කාෆී රාගයේ කෝමළ ස්වර හතරක් යෙදේ.
(4) යමන් රාගයේ නිශාදය සංවාදී ස්වරය වේ.

07. රාගයක නොයෙදන එහෙත් අලංකාරය සඳහා කලාතුරකින් යොදාගන්නා ස්වරය හඳුන්වන නම කුමක් ද?
(1) වාදී (2) විවාදී (3) සංවාදී (4) වර්ජිත

08. නිර්දේශිත රාග අතුරින් ශුද්ධ ස්වර පමණක් යෙදෙන රාග යුගලය තෝරන්න.
(1) බිලාවල් සහ භූපාලි (2) භූපාලි සහ යමන්
(3) යමන් සහ භෛරවී (4) භෛරවී සහ කාෆී

09. ආරෝහණයේ දී ස්වර හයක් ද අවරෝහණයේ දී ස්වර පහක් ද යෙදෙන රාගයක ජාතිය හඳුන්වන්නේ කෙසේ ද?
(1) ඖඩව, සම්පූර්ණ (2) ෂාඩය, ඖඩව (3) සම්පූර්ණ, ෂාඩව (4) ෂාඩව, ඖඩව

10. ස්වර වලින් පමණක් නිර්මාණය වී ඇති ගීතය වන්නේ,
(1) ලක්ෂණ ගීතය යි. (2) මධ්‍යලය ගීතය යි.
(3) ස්වර ස්ථාපන ගීතය යි. (4) සර්ගම් ගීතය යි.

Past Papers Wiki

11. තබ්ලාවේ දායං කොටසින් පමණක් උපදවා ගත හැකි අවනද්ධ අක්ෂර යුගලය ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ධා, ධිං (2) තා, තිං (3) ක, කක් (4) ගෙ, න

12. දීප් චන්දි තාලයට සමානව මාත්‍රා බෙදෙන දේශීය තිත කුමක් ද?
(1) සුළු මැදුම් දෙතිත. (2) සුළු මහ දෙතිත.
(3) මැදුම් මහ දෙතිත. (4) දෙසුළු මැදුම් තුන් තිත.

13. ජන ගී වර්ගීකරණයේ දී සංදේශ කාව්‍ය අයත් වන්නේ කුමන වර්ගයකට ද?
(1) මෙහෙ ගී (2) බැති ගී (3) සමාජ ගී (4) සේ ගී

14. සැළලිහිණි සංදේශයේ සමුද්‍රඝෝෂ විරිතට ගායනය කරන ගී පාදය තෝරන්න.
(1) සදවා සුදු වැලි පිවිතුරු (2) මනමත් කරවන දන මුළු දෙරණා
(3) රූ රැසේ අදිනාලෙස් (4) පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට

15. ''ගල්ලෙන බිඳලා'' ''වගුරට නරනිඳු'' යන ගීත ඇතුළත් නව නාට්‍යයේ නම කුමක් ද?
(1) මනමේ (2) සිංහබාහු (3) කාලගෝල (4) වෙස්සන්තර

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත දී ඇති සංගීත භාණ්ඩවල රූප සටහන් ඇතුළත් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

A	B	C	D
			

16. ස්වර පිහිටීම අතින් සමාන සංගීත භාණ්ඩ යුගලය අයත් ඉංග්‍රීසි අක්ෂර සඳහන් පිළිතුර කුමක් ද?
(1) A, B (2) B, C (3) C, D (4) D, A

17. පික් (Pick) සහ මිස්රාබ් (Mizrab) යන උපකරණ ආධාරයන් වයන සංගීත භාණ්ඩ යුගලය පිළිවෙලින් දැක්වෙන අක්ෂරය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, C (2) B, D (3) C, A (4) D, B

18. "C" අක්ෂරයෙන් දැක්වෙන සංගීත භාණ්ඩය වාදනයට ප්‍රවීණත්වය දක්වන උතුරු ඉන්දියානු සංගීතඥයාගේ නම කුමක් ද?
(1) ශිල්පී ශකීර් හුසේන් (2) ශිල්පී ජග්ජිත් සිං
(3) ශිල්පී රවි ශංකර් (4) ශිල්පී හරිප්‍රසාද් චෞරසියා

19. ''මුරලි'' සහ ''බන්සුරි'' යන දෙයාකාරයකට නිර්මාණය කර ඇති සංගීත භාණ්ඩය සඳහන් ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

20. මන්ද්‍ර ගාන්ධාරය (ග) පහළ ම ස්වරය ලෙස සුසර කර ගන්නා සංගීත භාණ්ඩය සඳහන් ඉංග්‍රීසි අක්ෂර කුමක් ද?
(1) A (2) B (3) C (4) D

21. 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට සපිරෙන්නේ අවුරුදු,

(1) 25 කි. (2) 50 කි. (3) 75 කි. (4) 100 කි.

22. ග්‍රැමෆෝන් තැටි සඳහා පටිගත කළ පළමු සිංහල ගීත වර්ගය වන්නේ,

(1) නූර්ති ගීත යි. (2) සරල ගීත යි.

(3) චිත්‍රපට ගීත යි. (4) නව නාට්‍ය ගීත යි.

23. දොළොස්මත් සේ ගී පාදය තෝරන්න.

(1) සඳවා සුදු වැලි පිවිතුරු (2) පැහැරණිය මිණිපැමිණිය කොත් අගට

(3) රූ රැසේ අත් ලෙල දීදී විදුලිය පබා (4) මන්මත් කරවන දන මුළු දෙරණ

24. නාඩගම් සංගීතයේ ආභාසයය ලබා ඇති ''ආලේ බැන්ද මාගේ රම්‍ය වන්'' යන ගීතය ඇතුළත් නව නාට්‍ය කුමක් ද?

(1) මනමේ (2) සිංහබාහු (3) කාලගෝල (4) වෙස්සන්තර

25. කෆිරිඤ්ඤා සංගීත සම්ප්‍රදාය ඇසුරින් නිර්මාණය කර ඇති සරල ගීත ගායනය කරනු ලැබූ ගායකයින් දෙපළක් සඳහක් පිළිතුර කුමක් ද?

(1) W. D. අමරදේව සහ වික්ටර් රත්නායක. (2) ලයනල් රංවල සහ රෝහණ බැද්දගේ

(3) ආනන්ද සමරකෝන සහ සුනිල් ශාන්ත (4) M. S. ප්‍රනාන්දු සහ C. T. ප්‍රනාන්දු

26. ජප් තාලයට සමානව මාත්‍රා බෙදී ඇති රිද්ම රටාව තෝරන්න.

(1) | ×× | ×× | ×× | ×× | (2) | ××× | ×××× | ××× | ××××|

(3) | ×× | ×××| ×× | ×××| (4) | ××× | ××× | ××× | ×××|

27. ''තෙරේ මේරේ මිලනි කී හේ රෙනා'' යන හින්දි චිත්‍රපට ගීතය ඇතුළත් චිත්‍රපටය කුමක් ද?

(1) අභිමාන් (2) දේවිදාස් (3) සංගම් (4) බව්ජිබව්රා

28. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස මද්දලය යොදා ගන්නා රංග සම්ප්‍රදාය කුමක් ද?

(1) සොකරි (2) කෝළම් (3) නූර්ති (4) නාඩගම්

29. ස්වර සංඛ්‍යාතය 426 Hz ක අගය ගන්නා ස්වරය කුමක් ද?

(1) ග (2) ම (3) ප (4) ධ

30. පංච තූර්ය භාණ්ඩ වර්ගීකරණය යටතේ, ආතත, විතත, විතතාතත යන ගණයන්ට ඇතුළත් වාද්‍ය භාණ්ඩ පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) දවුල, තම්මැට්ටම, උඩරට බෙරය (2) උඩරට බෙරය, තම්මැට්ටම, දවුල

(3) උඩරට බෙරය, දවුල, තම්මැට්ටම (4) තම්මැට්ටම, දවුල, උඩරට බෙරය

31. ගීතයක ප්‍රධාන නාද මාලාව සමගම ඊට ගැලපෙන සේ වෙනත් නාද මාලාවක් වාදනය වීම හඳුන්වන්නේ,

(1) Bit නමිනි. (2) Introduction නමිනි.

(3) Counter Point නමිනි. (4) Interlude නමිනි.

- අංක 32 සිට 35 දක්වා ප්‍රශ්නවලට බටහිර සංගීත ස්වර ප්‍රස්තාරයක දැකිය හැකි පහත දී ඇති පාරිභාෂික වචන ඇසුරින් පිළිතුරු සපයන්න.

A .	Clef
B .	Key signature
C .	Time signature
D .	Rest Mark
E .	Tie Mark'
F .	Repetation Mark
G .	Sign to sing Mark

32. ඉහත සංකේත අතුරෙන් බටහිර ස්වර ප්‍රස්තාරයක තාලය පෙන්නුම් කරන අක්ෂරය සඳහන් පිළිතුර තෝරන්න.

(1) A (2) B (3) C (4) D

33. ප්‍රස්තරයක ශ්‍රැති ස්වර හඳුනාගැනීමට යෙදිය යුතු සංකේතය ඇතුළත් අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) E (4) F

34. % මෙම සංකේතය හඳුන්වන නම ඇත්තේ කුමන අක්ෂය යටතේ ද?

(1) G (2) F (3) E (4) D

35. පහත දී ඇති සංකේත හඳුන්වන නම් සඳහන් නිවැරදි අක්ෂර පේළිවෙල තෝරන්න.

1. Ô 2. 3/4 3. & 4. Î

(1) A. C. D. F (2) D. A. C. F (3) F. C. A. D (4) F. D. C. A

36. මහනුවර යුගයේ දී වන්නම්, ප්‍රශස්ති සහ හටන් යන සේ ගී වර්ග ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ බවට සඳහන් ස්ථානය කුමක් ද?

(1) කමත (2) තානායම්පොළ (3) කරලිය (4) කවිකාරමඩුව

37. නි̇ රි ග ම′ප ධ නි ස̇ මෙම ස්වර ආරෝහණය, මධ්‍යම භාවයට හැරවූ විට ලැබෙන නිවැරදි ස්වර සඳහන් පිළිතුර කුමක් ද?

(1) ම ප ධ නි̲ ස̇ රි̇ ග̇ ම̇ (2) ග ප ධ නි ස̇ රි̇ ග̇ ම̇
(3) ග ප ධ නි̲ ස̇ රි̇ ග̇ ම̇ (4) ග ම ප ධ නි̲ ස̇ රි̇ ග̇

38. E, Lerning යනු,

(1) විද්‍යුත් මාධ්‍ය මඟින් කරනු ලබන ඉගෙනුම යි.
(2) පරිගණකය ඇසුරින් සංගීතය නිර්මාණය කිරීම යි.
(3) සංගීතමය නාද කිසියම් විද්‍යුත් අංකිත ක්‍රමයකට හුවමාරු කිරීම යි.
(4) විද්‍යුත් සංගීත භාණ්ඩ මඟින් සංගීතය සැපයීම යි.

39. තාක්ෂණික මෙවලම් භාවිතයේ දී ශබ්දය ග්‍රහණය කරගනු ලබන්නේ,

(1) බෆල් වලිනි. (2) මයික්‍රෆෝන් මඟිනි.
(3) ඇම්පිලිෆයර් මඟිනි. (4) මික්ෂර් ආධාරයෙනි.

40. පරිගණකය තුළ සංගීතය පටිගත කිරීමට යොදාගන්නා මෘදුකාංගයක් වන්නේ මින් කුමක් ද?

(1) Indesing (2) Page meaker (3) Adobe Audition (4) Word

(ලකුණු 1 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

පෙරදිග සංගීතය - II

කාලය පැය 02 යි.
අමතර කාලය මිනිත්තු 10

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**
- **සියලුම ප්‍රශ්න සඳහා ලකුණු දොළහ බැගින් හිමි වේ.**

01. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) හෙරවී රාගයේ යෙදෙන ප්‍රධාන ස්වර සංගතියක් ලියන්න. (ල. 01)

(ii) දීප් චන්දි තාලයට අනුව පද කැටිකළ හැකි ගී පාදයක් ලියන්න. (ල. 01)

(iii) විෂමග්‍රහයෙන් ආඝාතය තබා ගැයෙන ජනප්‍රිය ගීතයක මුල් පද පේළිය ලියන්න. (ල. 01)

(iv) ස් ධ නි ප, නි ප ධ ම, ... යන අවරෝහණ ශුද්ධ ස්වර අභාසයේ ආරෝහණය ආරම්භ කරන ස්වර හතර ලියන්න. (ල. 01)

- අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහත සඳහන් ගී පාද උපයෝගී කර ගන්න.
  - ★ මිහිමඩලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා
  - ★ සඳවා සුදු වැලි පිවිතුරු
  - ★ ඇසේ මධුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ
  - ★ ආදරයේ උල්පත වූ අම්මා

(v) මැදුම් තනි තිතට අනුව ගැයෙන සේ ගී පාදය තෝරා ලියන්න. (ල. 01)

(vi) ආනන්ද සමරකෝන් මහතා විසින් ගැයූ මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයට අයත් ගී පාදය කුමක් ද? (ල. 01)

(vii) බටහිර තාල සංකේතයක් වන $\frac{3}{4}$ TIME SIGNATURE යෙදිය හැකි සරල ගී පාදය තෝරා ලියන්න. (ල. 01)

(viii) දරු නැලවිලි ගී නාද මාලාව අනුව තනුව නිර්මාණය වූ ගී පාදය කුමක් ද? (ල. 01)

- අංක (ix) සිට (x) තෙක් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයේ පිළිවෙලින් ලියා දක්වන්න.

(ix) ගායනයේ දී ආඝාතය තබමින් ගයන ජන ගීත .....
ගීත ලෙසත් ආඝාතය නොතබා ගයන ජන ගීත ..... ලෙසත් හඳුන්වයි. (ල. 02)

(x) ''උදයට පායන ඉරු දෙවියන්ටයි.'' යන ගොයම් ගීතයේ සැඳැස්මත් ගණන ..... ක් වන අතර ගීමත් ..... කි. (ල. 02)

(මුළු ලකුණු - 12)

02. නිර්දේශික රාග දෙකකට අදාළව පහත දක්වා ඇති තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) මේලය කල්‍යාණ වන අතර ජාතිය සම්පූර්ණ වේ.

(b) තීව්‍ර මධ්‍යමය විවාදී ස්වරයක් ලෙස යොදා ගනී.

(c) වාදී ස්වරය මධ්‍යමය යි.

(d) බොහෝ විට මධ්‍ය සජ්ජය අතහැර මන්ද්‍ර නිශාදයෙන් රාග සංගතිය අරඹයි.

(e) ධමධනිස යන ස්වර සංගතියේ 'ධ' සහ 'නි' ස්වර කෝමළ වේ.

(f) එක් විකෘති ස්වරයක් පමණක් යොදාගෙන සප්තක තුනම ඇසුරු කරයි.

(i) ඉහත තොරතුරුවලට අදාළ රාග දෙක නම් කරන්න. (ල. 01)

(ii) එම රාග දෙකට අයත් තොරතුරු සඳහන් ඉංග්‍රීසි අක්ෂර රාග දෙකට අදාළව වෙන් කොට දක්වන්න. (ල. 03)

(iii) ඉහත රාග දෙකෙන් එකකට අයත් පහත දී ඇති ගීත වලින් එකක් තෝරාගෙන ස්ථායී සහ අන්තරා ස්වර ප්‍රස්තාර කරන්න.

a. මධ්‍යලය ගීතය
b. මධ්‍යලය වාදිතය
c. සර්ගම් ගීතය
d. ලක්ෂණ ගීතය (ල. 08)

(මුළු ලකුණු 12)

03. (i) නිර්දේශිත රාගවලට අදාළ ව පහත දැක්වෙනරාග සංසන්දනාත්මක තොරතුරු වලින් හැඳින්වෙන රාග යුගලයන් පිළිවෙලින් නම් කරන්න. (ල. 03)

(a) ඨාඨයෙන් සමාන එහෙත් ජාතිය අසමාන වේ.
(b) සංවාදී ස්වරය සමාන එහෙත් වාදි ස්වර අසමාන වේ.
(c) ශුද්ධ ස්වර පමණක් යෙදෙන එහෙත් ස්වර දෙකක් වර්ජිත වේ.

(ii) ගායන සමය සමාන නිර්දේශිත රාග යුගලයන් දෙක නම්කර, ඊට අදාළ ගායන සමයන් දෙක ලියා දක්වන්න. (ල. 04)

(iii) නිර්දේශිත රාගයක් තෝරාගෙන එම රාගය නම්කර ඊට අදාළ ව දීප්චන්දි තාලයේ ආවර්ථ දෙකක් සම්පූර්ණ වන අයුරින් රාගාශ්‍රිත ස්වර රචනාවක් නිර්මාණය කරන්න. (ල. 05)

(මුළු ලකුණු 12)

04. පහත දැක්වෙන්නේ තබ්ලාවෙන් වාදනය කළ හැකි අවනද්ධ අක්ෂර හතකි.
ධා, කි, තා, ධි, තා, ධිං, තිං

(i) ඉහත සඳහන් අවනද්ධ අක්ෂර යොදාගනිමින් වාදනය කළ හැකි නිර්දේශිත හින්දුස්ථානි තාල තුනක් නම් කරන්න. (ල. 03)

(ii) ඉන් එක් තාලයක් නම් කර, නියමිත තාල සංඥා සහ මාත්‍රා සහිතව එය ප්‍රස්තාර කරන්න. (ල. 06)

(iii) ඉහත ප්‍රස්තාර කළ හින්දුස්ථානි තාලයට සමාන දේශීය තිත නම් කර ඊට අයත් බෙර පදයක්, නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 03)

(මුළු ලකුණු 12)

05. පහත දැක්වෙන්නේ ගැමි ගී හා සේ ගී වලට අයත් ජන ගී කිහිපයක මුල් පද පේළි අටකි.

★ ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ
★ සඳවා සුදු වැලි පිවිතුරු
★ ලක්ෂ්මි බුජ වාසා
★ උදයට පායන ඉරු දෙවියන්ටයි.
★ මෝරා බිජයෙනා
★ මේ කොතනින් ගෙනා ගොනා
★ නොමදින් විකුම්පාලා


(i) ඉහත සඳහන් ජන ගී ගැමි ගී සහ සේ ගී යටතේ වෙන්කොට ලියා දක්වන්න. (ල. 04)

(ii) ගැමි ගී සහ සේ ගී අතර දැකිය හැකි වෙනස්කම් හතරක් වගුගත කරන්නත (ල. 04)

(iii) ඉහත සඳහන් ජන ගී අතරින් එක් ගීතයක් තෝරාගෙන, එය කුමන ගී වර්ගයකට අයත් දැයි නම් කර, එම ගීතයේ මුල් පද කොටස පේළි හතරකට නො අඩුවන සේ ලියා දක්වන්න (ල. 04)

(මුළු ලකුණු - 12)

06. පහත සඳහන් බටහිර සංගීත ස්වර ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) ඉහත ප්‍රස්තාරයේ අංක 1 සිට 4 දක්වා සඳහන් කර ඇති සංකේත නම් කරන්න. (ල. 04)

(ii) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග පෙරලා තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ල. 04)

(iii) ඔබ විසින් පෙරදිග ක්‍රමයට ලියූ ප්‍රස්තාරයේ මුල් විභාග හතර මධ්‍යම භාවයට හරවා නැවත ප්‍රස්තාර කරන්න. (ල. 04)

(මුළු ලකුණු - 12)

07. පහත සඳහන් ශිල්පීන් අතුරින් දේශීය හා විදේශීය ශිල්පීන් එක් අයෙකු බැගින් තෝරාගෙන එම දෙදෙනා සංගීත ක්ෂේත්‍රයට සිදු කර ඇති සේවාව අගයමින් කෙටියෙන් විස්තර කරන්න.

(1) ශකීර් හුසේන්
(2) ලයනල් රංවල
(3) ඩබ්ලිව්. බී. මකුලොලුව
(4) හරිප්‍රසාද් චෞරසියා
(5) සී. ද. එස්. කුලතිලක
(6) ඒ. ආර්. රහුමාන්

(මුළු ලකුණු 2 × 6 = 12)

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(3)	2 -(4)	3 -(1)	4 -(2)	5 -(1)	6 -(4)	7 -(2)	8 -(1)	9 -(2)	10 -(4)
11 -(2)	12 -(3)	13 -(4)	14 -(4)	15 -(2)	16 -(2)	17 -(1)	18 -(3)	19 -(4)	20 -(1)
21 -(4)	22 -(1)	23 -(1)	24 -(3)	25 -(4)	26 -(3)	27 -(1)	28 -(4)	29 -(4)	30 -(2)
31 -(3)	32 -(3)	33 -(2)	34 -(1)	35 -(3)	36 -(4)	37 -(2)	38 -(1)	39 -(2)	40 -(3)

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

II පත්‍රය

01. (i) භෛරවී රාගයේ ප්‍රධාන ස්වර සංගතියෙක්, ලියා ඇත්නම් (ල. 01)
(ii) මාත්‍රා කැටිවීම දීප් චන්දි තාලයට ගැලපේනම් (ල. 01)
(iii) විෂමග්‍රහය සහිත ජනප්‍රිය ගීතයක මුල්පද පේළියට (ල. 01)
(iv) ස ග රි ම (ල. 01)
(v) සඳවා සුදු වැලි පිවිතුරු (ල. 01)
(vi) ඇසේ මඬුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ (ල. 01)
(vii) මිහිමඬලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා (ල. 01)
(viii) ආදරයේ උල්පත වූ අම්මා (ල. 01)
(ix) ආඝාතාත්මක, අනාඝාතාත්මක (ල. 02)
(x) 16, 24 (ල. 02)
(මුළු ලකුණු - 12)

02. (i) යමන්, භෛවී රාග දෙක නම් කිරීමට (ල. 01)
(ii) යමන් රාගය භෛරවි රාගය
a, b,f b, c, e (½ × 6 ල. 03)
(iii) තෝරාගත් එක් ගීතයක ස්ථායී කොටස ස්වර ප්‍රස්තාර කර ඇත්නම් (ල. 04)
අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු (ල. 04)
(මුළු ලකුණු - 12)

03. (i) a. යමන් සහ භූපාලී b. භෛරවී - කාෆී C. බිලාවල් - භූපාලී (ල. 03)
(ii) බිලාවල් - භෛරවි - දිවා ප්‍රථම
යමන් - භූපාලි - රාත්‍රී ප්‍රථම (ල. 04)
(iii) දීප් චන්දි තාලයට අනුව රාගාශ්‍රිත ස්වර රචනාවක් ආවර්ථ දෙකක් නිර්මාණය කිරීමට (ල. 04)
රාගය නම් කිරීමට (ල. 01)
(මුළු ලකුණු - 12)

04. (i) ත්‍රීතාලය, ජප්තාලය, දීප්චන්දි තාලය නම් කිරීමට (ල. 03)
(ii) නම් කරන ලද තාලයේ මාත්‍රා සහ තාල සංඥා සහිතව ප්‍රස්තාරකළ යේකාවට (ල. 06)
(iii) හින්දුස්ථානි තාලයට සමාන බෙරපදය නම් කිරීම. (ල. 01)
(මුළු ලකුණු - 12)

05. (i) ගැමි ගී හා සේ ගී වශයෙන් බෙදා වෙන් කිරීමට (ල. 04)
(ii) ගැමි ගී සහ සේ ගී අතර වෙනස්කම් හතරක් ලිවීමට (ල. 04)
(iii) තෝරාගත් ගීතය කුමන ගී වර්ගයක් දැයි නම් කර මුල්පද පේළි හතරක් ලියා ඇත්නම් (ල. 04)
(මුළු ලකුණු - 12)

06. (i) 1. Treble clef . (G. clef) 2. Time Signature
3. Bar line 4. Tie mark (Bind Mark) (ල. 04)
(ii) | සරිගග | ග-ග- | මගමග | මගරි- |
| ගමප- | ග-සස | රිගගස | ---- | (½ × 8 ල. 04)
(iii) | මපධධ | ධ-ධ- | <u>නි</u>ධනිධ | <u>නි</u>ධප-| (ල. 04)
(මුළු ලකුණු - 12)

07. දේශීය හා විදේශීය ශිල්පීන් දෙදෙනෙකු පිළිබඳ ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර කෙටි සටහනක් ලියා ඇත්නම් ලකුණු 6 බැගින් × 2 = 12

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය **පෙරදිග සංගීතය - ප්‍රයෝගික පරීක්ෂණය**

ප්‍රශ්න අංකය		ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර	ලකුණු
01	1.	පරීක්ෂක විසින් අක්ෂර භාවිතයෙන් ගයනු ලබන ස්වර හතර හඳුනාගෙන නම් කිරීම.	04
	2.	• පරීක්ෂක විසින් ගයනු, වයනු ලබන සරල ගීතය සඳහා වාදනය සුදුසු හින්දුස්ථානී තාලය හඳුගෙන නම් කිරීම. • ඉහත නම් කළ තාලයේ තාල පදය විභාග කිරීම. • එම තාලයට ගැළපෙන වෙනත් ගීතයක මුල් පාදයක් ලිවීම. • ඉහත තාලයට සමාන දේශීය තිත නම් කිරීම.	01 01 01 01
	3.	පරීක්ෂ විසින් ගයනු ලබන නිර්දේශිත රාගයක ස්වර සංගති ශ්‍රවණය කර, එම රාගය ආශ්‍රිතව අසනු ලබන ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම. (රාගයේ නම, අරෝ / අවරෝහණ / රාගයේ විශේෂ ලක්ෂණයක්)	04
02		(අපේක්ෂකයා තෝරාගත් ප්‍රධාන විෂය අනුව ඉදිරිපත් කළ යුතුය.) හෙරවී, යමන් යන නිර්දේශිත රාග දෙකෙන් එක් රාගයක ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් / වාදිතයක් ඉදිරිපත් කිරීම. (ආරෝහණ, අවරෝහණ, ස්ථායී, අන්තරා)	5 × 4 20
03		• (අපේක්ෂකයා තෝරාගත් ප්‍රධාන විෂය අනුව ඉදිරිපත් කළ යුතුය.) පරීක්ෂක විසින් නම්කරන ඉහත රාග දෙකෙන් එක් රාගයකට අයත් සර්ගම් ගීතයක් හෝ ලක්ෂණ ගීතයක් ගායනය / වාදනය කිරීම. • (අ සහ පරීක්ෂක විසින් ඉදිරිපත් කරන එම රාගයට අයත් ස්වර බණ්ඩය අනුකරණය කරමින් ගායනය / වාදනය කිරීම. (ප්‍රශ්න අංක 02 යටතේ ඉදිරිපත් නොකළ ඉතිරි රාගය නම් කළ යුතුය.)	08 04
04		• (අපේක්ෂකයා කැමති ආකාරයට ගායනය හෝ වාදනය තෝරාගත හැකිය.) පහත සඳහන් ගීත කාණ්ඩ අතුරින් අපේක්ෂකයා තෝරාගත් කාණ්ඩයේ සඳහන් ගීත වර්ග දෙකෙන් එක් ගීතයක් ඉදිරිපත් කළ හැකි වේ. (★ සිංහල / හින්දි සරල ගී හෝ චිත්‍රපට ගී ★ නූර්ති ගී හෝ නාඩගම් ගී, ★ නාට්‍ය ගී හෝ ගීත නාට්‍ය ගී ★ ග්‍රැමෆෝන් ගී හෝ කණ්ඩායම් ගී	16
05	1	නිර්දේශිත ගැමි ගීයක් ගායනය කිරීම.	08
	2	වන්නම් / ප්‍රශස්ති / හටන් යන ගීත අතුරින් කැමති ගීයක් ගායනය කිරීම.	08
06	1	අපේක්ෂකයා කැමැති ස්වර වාද්‍ය භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය කිරීම හෝ තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස තබලාවෙන් නිර්දේශිත තාලයක යේකාව සමඟ කායදාවක් වාදනය කිරීම.	12
	2	ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් කැමැති ගීතයක් වාදනය කිරීම.	12
		මුළු ලකුණු	100

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank